**ශ්‍රී ලංකා කලා මණ්ඩලය - 2022**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------------------ | ------------------------- | ----------- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත 15 හි 14 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අයවැය ලේඛනයේ වටිනාකම් හා සත්‍ය වටිනාකම් අතර සැසඳීමක් ඇතුළත් කර හෝ අයවැය ලේඛනයේ වටිනාකම් හා සත්‍ය වටිනාකම් අතර වන ප්‍රමාණාත්මක වෙනස්කම් සඳහා හේතු පැහැදිලි කිරීම කර නොතිබුණි. | අයවැය ලේඛණය සකස් කරන අවස්ථාවේ දී සිටි විධායක සභාව වෙනුවට 2022 නොවැම්බර් මසදී නව විධායක සභාවක් පත් කිරීම මේ සඳහා හේතු විය. | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | -------------------- | ----------- |
| (අ) | වාර්ෂික ගිණුම් පියවීම ලෙස රු.61,469ක වටිනාකමක් ශේෂ පිරික්සුමේ බැරට ඇතුළත් කර තිබුණද, ලෙජරය අනුව එවැනි ගිණුමක් නොතිබුණි. ස්කන්ධ වෙනස් වීම් ප්‍රකාශයට රු.22,281ක ප්‍රමාණයක් ගලපා තිබුණද, එය ගණනය කළ ආකාරය හා එසේ ඇතුළත් කිරීමට හේතු පැහැදිලි කර නොතිබුණි. | ශේෂ පිරික්සුම මගින් නිවැරදි කර ඉදිරිපත් කර ඇත. | නිවැරදි අගයන් නිවැරදි ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂය සඳහා ස්ථාවර තැම්පතු පොළී ආදායම රු.103,316ක් වුවත් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ එම අගය රු.25,000ක් ලෙස රු.78,316ක් අඩුවෙන් දක්වා තිබූ අතර 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොළී ආදායම රු.92,179ක් වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එම අගය රු.15,000ක් ලෙස රු.77,179ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙහි කිසියම් දෝෂයක් වේ නම් 2023 ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේ දි නිවැරදි කිරීමට කටයුතු යොදමි. | නිවැරදි ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022 වර්ෂය සඳහා නියමිත පාරිතෝෂික වියදම රු.43,458 ක් වුවද, එය රු.70,960ක් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට ගලපා තිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ ලාභය රු,27,502කින් අඩුවෙන් දක්වා තිබුණි. | ශේෂ පිරික්සුම මගින් නිවැරදි කර ඉදිරිපත් කර ඇත. | නිවැරදි ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ප්‍රකාශන තොගය | 1,175,483 | කලා සඟරාව - 2014 සැප්තැම්බර් කලාපයට සහ දෙසැම්බර් කලාපයට අදාල ඒකක පිරිවැයද බුද්ධ ප්‍රතිමා නිර්මාණ කලාව නැමති ප්‍රකාශනයට අදාල ඒකක විකුණුම් මිලද දක්වා නොතිබීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වුණු රු.1,175,483 ක තොගයෙහි නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කරගත නොහැකි විය. | 2023 වර්ෂයේ ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේ දී මෙම වැරදි නිවැරදි කිරීමට කටයුතු කරන බව සඳහන් කරමි. | අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| සම්පත්දායක දිමනා | 270,000 | ශාන්තිකර්ම වැඩ සටහන් 02 ක් සඳහා එකතුව රු.210,000 ක් හා නාට්‍ය වැඩමුළුව සඳහා ශිල්පීන් 03 කට රු.60,000 ක් ද ගෙවා තිබුණි. මෙම ශිල්පීන් තෝරාගත් පදනම විගණනයට හෙළිදරව් නොකෙරුණි. එසේම සම්පත්දායක දිමනා ගෙවීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවද ඒ සඳහා අනුමැතිය ලබාගත් බවට තොරතුරු අනාවරණය නොවුණි. | මෙම වැඩමුළු සඳහා සම්බන්ධ වන සම්පත්දායකයින් විෂය ප්‍රවීණයින් වන අතර පවත්නා රජයේ චක්‍රලේඛ ගෙවීම් යටතේ ඔවුන්ගේ සේවය ලබා ගැනීමේ දුෂ්කරතාවක් මතු විය. | දිමනා ගෙවීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1952 අංක 18 දරන ශ්‍රී ලංකා කලා මණ්ඩල පනතේ 12 වන වගන්තිය | උපදේශක සභා රැස්වීම්වලදී ගනු ලබන තීරණවල ප්‍රගතිය මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර මණ්ඩලය ද ඒ සම්බන්ධයෙන් පසුවිපරම් | උපදේශක සභා රැස්වීම්වල ප්‍රගතිය හා පසුවිපරම් කටයුතු සිදුකිරීමට අවශ්‍ය කටයුතු විධිමත්ව පාලනය කිරීමට | පනතේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | කටයුතු සිදුකර නොතිබුණි. එසේම, උපදේශක සභාවල ක්‍රියාකාරීත්වය, කාර්යභාරයන් හා වගකීම සම්බන්ධයෙන්ද පනතේ පැහැදිලිව සඳහන්ව නොතිබුණි. | විධායක සභාවේ එකඟතාව ඇතිවිය. | |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) | **මුදල් රෙගුලාසි 445(i)** | පුද්ගල වැටුප් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | 2023 ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේ දි නිවැරදි කිරීමට කටයුතු යොදමි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය |
| (ii) | **මුදල් රෙගුලාසි 264(i)** | වැඩසටහන් තුනක් සඳහා එකතුව රු.72,300 ක් වැයකර තිබුණ අතර එම වියදම් සඳහා බිල්පත් ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි අයුරින් කටයුතු කිරීමට අවශ්‍ය පිළියම් යොදමි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය |
| (ඇ) | **1978දෙසැම්බර් 19දිනැති අංක 842දරන භාණ්ඩාගාර චක්‍රලේඛය** | මණ්ඩලය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | 2023 ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේ දි නිවැරදි කිරීමට කටයුතු යොදමි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.369,171 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු3,176,242 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,807,071 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පරිපාලන හා ආයතන වියදම් රු,6,108,331 කින් හා වැඩමුළු, වැඩසටහන් වියදම් හා මූල්‍ය අනුග්‍රාහකත්ව දැක්වීම් සඳහා වූ වියදම් රු.2,222,062 කින් හා පුනරාවර්තන ලැබීම් රු. 3,437,612 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ---------------------- | ------------- |
| (අ) | දිවයිනේ සියලු සංස්කෘතික මධ්‍යස්ථාන, කලායතන හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල කේන්ද්‍ර කර | මෙම වැඩමුළු සඳහා සම්බන්ධ වන සම්පත්දායකයින් විෂය | සැලසුම්ගත කාර්යයන් ඉටු කිරීමට යටයතු |

| | | | |
|---|---|---|---|
| | ගනිමින් සංගීත, නර්තනය හා නාට්‍ය යන විෂය ක්ෂේත්‍ර නියෝජනය වන අයුරින් එක් ක්ෂේත්‍රයකින් ප්‍රාසාංගික දෙසුම් 02 බැගින් වැඩමුළු 06 ක් 2022 වර්ෂයේ පැවැත්වීමට සැලසුම් කර තිබුණද, වැඩසටහන් 5ක් පවත්වා නොතිබුණි. | ප්‍රවීණයින් වන අතර පවත්නා රජයේ චක්‍රලේඛ ගෙවීම් යටතේ ඔවුන්ගේ සේවය ලබා ගැනීමේ දුෂ්කරතාවක් මතු විය. | කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා කලා මණ්ඩලය යටතේ අනුමණ්ඩල 11 ක් පිහිටුවා ඇති නමුත් එම අනුමණ්ඩල 11 මඟින් ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් සැලසුම් කර සංශෝධිත ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර නොතිබුණ බැවින් වර්ෂය තුළ දි එම අනුමණ්ඩල විසින් එක් එක් කලා ක්ෂේත්‍රයන්හි ජාතික අගය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ දායකත්වයක් ලබා දී නොතිබුණු බව නිරීක්ෂණය විය. | සෑම ව්‍යාපෘතියක් හා වැඩසටහනක් වෙනුවෙන්ම අනුමණ්ඩල වල සහය හා එක් එක් කලා ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගේ උපදේශකත්වය අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක වේ. | සැලසුම් කළ වැඩසටහන් ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කළ යුතුය. |